# ශ්‍රී ලංකා ජනගහයේ මෑත කාලීන උපනතීන්

කේ. දිනිති පීරිස් [1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලින උපනතීන් පිළිබඳව අධ්‍යයනයේ දී 1871 ශ්‍රී ලංකාව තුළ පැවැත් වූ ප්‍රථම ජන සංගණනය වැදගත් වන අතර එය හේතුකොට ගෙන එම කාල වකවානුවේ පැවැති ගති ලක්ෂණයන් සහ එම ලක්ෂණයන් වර්තමානය වන විට එනම් 2012 අවසාන සංගණනය වන විට කොතෙක් දුරට වෙනස් වී ඇත් ද යන්න සහ 2012 සංගණනය පාදක කර ගනිමින් ශ්‍රීලංකාවේ වර්තමාන ජනගහනයේ හඳුනාගත හැකි උපනතින් මොනවාද යන්න මෙම ලිපිය මගින් මූලිකව ම සාකච්ඡාවට ලක්කර ඇත. මෙම මෑත කාලින උපනතින් ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ගමනට එල්ල කරන බලපෑමත් මෙහිදි සැකවින් සාකච්ඡාවට ලක්කොට ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලින උපනතීන් පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනයේ දි ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසිම, නගර කරා ජනයා ඇදි යාම, රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදෙස්ගත විමේ සංඛ්‍යාව වැඩි විම, ළමා ජන සංඛ්‍යාව අඩු වීම, ජන සංඛ්‍යාව වයස්ගත විමේ ප්‍රවනතාවක් දක්නට ලැබිම, මුළු ජනගහනයෙන් ස්ත්‍රී ප්‍රතිශතය ඉහළ යාම ආදී ප්‍රධාන උපනතින් කිහිපයක් හඳුනාගත හැක.

## හැඳින්වීම

ඕනෑම රටක ජන සංඛ්‍යාව යනු එරට ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබිඹු කරන ප්‍රධානත ම සාධකයක් ලෙස පෙන්වා දිය හැක. ධනාත්මකව මෙන්ම ඍණාත්මකව ද යම් සමාජයක ජනගහනයක් එම රටේ සංවර්ධනය හා බැදි පවතින ශ්‍රි ලංකා ජනගහනය පිළිබඳව අධ්‍යයනයේදි ජන සංඛ්‍යාව වැදගත් සාධකයක් බවට පත් වන්නේ සංවර්ධනය වන රටක් ලෙස සංවර්ධිත රටක් බවට පත්විමේ අරමුණ සාක්ෂාත් කරගැනීමේදීය. රටේ ආර්ථිකය ගැන සැලකිමේදි ජනගහනය ඉතා තිරණාත්මක සාධකයක් බව අතිත උදාහරණ රාශියකින් ඔප්පු වි ඇත. ශ්‍රි ලංකාවේ ජනගහනවේ මෑතකාලීන උපනතීන් මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.

## ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන්

ශ්‍රි ලංකාවෙ මුල් වරට ජන සංගණනයක් සිදු කරනු ලැබුවේ 1871 වසරේදී ය. එම වසරේදී රටේ මුළු ජන සංඛ්‍යාව මිලියන 2.4 විය. කෙසේ වුව ද මුළු දිවයිනම ආවරණයවන පරිදි සංගණනයක් පැවැත්වුයේ 1981 වසරේදී ය. එහෙත් 2001 වසරේදී පැවති ජන සංගණනයේදී ආවරණය වුයේ දිස්ත්‍රික්ක 18ක් පමණි. 1981

---

[1] ආර්ථිකවිද්‍යා විශේෂවේදි උපාධි ප්‍රථම වසර, dinithipeiris13@gmail.com


වසරේ පැවැත් වූ ජන හා නිවාස සංගණනයට පසු අවසන් වරට මුළු දිවයිනම ආවරණය වන පරිදි සංගණනයක් පැවැත්වූයේ 2012 වසරේදී ය. 2012 මාර්තු 20 පැවැත්වූ සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහණය 20,359,439 ලෙස වාර්තා වේ. (ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය, 2012)

ජනගහනය වාර්ෂිකව ක්‍රමයෙන් වැඩිවන අතර 1871 ට සාපේක්ෂව 2012 වසර වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය අට ගුණයකට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. වර්තමානය වන විට විශාලතම ජනගහනය වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. එය මිලියන 2.3 වන අතර මුළු ජනගහනයෙන් 11.4 කි. ගම්පහ දිස්ත්‍රික්කයෙන් ද ඒ හා සමාන ජනගහනයක් ව්‍යාප්ත වී සිටින අතර එම ප්‍රමාණය 2.3 වන අතර මුළු ජනගහනයෙන් 11.3 කි. කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර හා ගාල්ල යන දිස්ත්‍රික්ක තුළ ද මිලියන එකකට අධික ජනගහනයක් වාර්තා වේ. මෙම දිස්ත්‍රික්ක හත තුළ මුළු ජනගහනයෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් එනම් 54 ක් සිටින අතර ඔවුන් ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් හතරෙන් එකකටත් වඩා අඩු භූමි ප්‍රමාණයක ව්‍යාප්තව ඇත. උතුරු පළාතේ මුලතිව්, මන්නාරම, කිලිනොච්චි සහ වව්නියාව යන දිස්ත්‍රික්ක තුළ පසුගිය කාලය තුළම අඩු ජනගහන ව්‍යාප්තියක් වාර්තා වේ. මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල ජනගහනය 100 000 කටත් අඩු ය. දිස්ත්‍රික්ක අතර ජනගහනය ව්‍යාප්ත වීමේ විෂමතාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී විවිධ වූ පැතිකඩ රාශියක් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කළ හැකිය. එනම් ජනගහනයේ විශාලත්වය,වර්ධනය සහ ව්‍යාප්තිය, විවාහකතත්වය, සාපල්‍යතාවය, සාක්ෂරතාවය, අධ්‍යාපනය ,සංක්‍රමණ, නාගරීකරණය, ආදියයි. මෙලෙස ගත් කළ ශ්‍රී ලංකා ජනගහනයේ මෑත කාලීනව හඳුනාගත හැකි උපනතීන් පහත පරිදි සාකච්ඡාවට බඳුන් කළ හැක.

1. ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසීම.

යම් රටක ජන සංඛ්‍යාව වර්ධනය වීම සිදු වන්නේ ක්‍රමානුකලව ය. 1871 පළමු සංගණනයේ දී 0.9 ක් වූ වර්ධන වේගය 1953 වන විට 2. 8 දක්වා ඉහළ ගියේ ය. ඉන් පසු වසර 30ට ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර 1981න් පසු වර්ධන වේගය මදක් අඩු විය. පළමු සංගණනයේදි ලක්ෂ 24 ක ජන සංඛ්‍යාව වසර 60 ක් ගතවීමෙන් පසු එනම් 1931 දි ලක්ෂ 53 බවට පත්විය. එහි සිට තවත් වසර 30ක් ගතවන විට ලක්ෂ 105ක් බවට පත්විය. 1999 වර්ෂයේදි 1.5 ක් වු ජන සංඛ්‍යා වර්ධන වේගය 2005 දි 1.1ක් වු අතර, එය 2007 දි 0.6 දක්වා පහත බැස ඇත. ස්ත්‍රීන්ගේ සාපල්‍යතාවය ජන සංඛ්‍යා වර්ධන වේගය සඳහා බලපායි. 1953 දි ස්ත්‍රින්ගේ සාපල්‍යතාවය 5.3 ක් වූ අතර, වර්තමානය වන විට 1.9 අඩුකර ගැනීමත් සමඟ ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමානුකලව අඩු විය. ඒ සඳහා ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම, වෛද්‍ය විද්‍යාවේ දියුණුව, කුඩා පවුල් කෙරෙහි අවධානය යොමු කිරිම, උපත් පාලන ක්‍රම අනගමනය කිරිම, ළදරු මරණ අඩුවීම, මාතෘ මරණ අඩුවීම ආදිය නිසා 2.8 ක තිබු වර්ධන වේගය 2001 වන විට 1.2 දක්වා ද 2012 සංගණන දත්ත වලට අනුව වර්තමානයේ එම අ.ය 0.7 ක් දක්වා පහළ බැස ඇති බව පැහැදිලිය. (ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය, 2012)

ප්‍රස්තාරය 01 : ජනගහනයේ විශාලත්වය සහ වර්ධනය 1871 - 2012




මූලාශ්‍රයඃ ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව, 2012

ඉහත රූප සටහනට අනුව 1946 න් පසු මරණ අනුපාතිකය සීග්‍රයෙන් පහත වැටෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජනගහන වර්ධන අනුපාතිකයන්හි අගය සියයට 2.0 කට වැඩ ඉහළට වැඩි විය. 1960 න් පසු උපත් අනුපතිකය ද ක්‍රමයෙන් පහළ බසින්නට විය. මෙම සිදුවීමත් සමඟ ජනගහන වර්ධන අනුපාතිකය ද පහත වැටෙන්නට විය. වර්තමානයේ එම අගය 0.7 වේ.

2. නගර කරා ජනයා ඇදී යාම.

වර්තමාන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජන සංඛ්‍යාව මෙන් ම නාගරික මට්ටම ද ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනය වැඩිම දිස්ත්‍රික්ක 8 වන්නේ කොළඹ, කඩුවෙල, දෙහිවල ගල්කිස්ස, මොරටුව, මීගමුව, කෝට්ටේ මහා නගර සභා සහ කැස්බෑව සහ මහරගම යන මහා නගර සභා ය. මුළු නාගරික ජනගහනයෙන් 50 පමණ මෙම නගර තුළ ජීවත් වේ. මෙම ප්‍රදේශයන් සියල්ලම බස්නාහිර පළාතට අයිතිවීම විශේෂ ලක්ෂණය කි. ඉන් 7ක් කොළඹ දිස්ත්‍රික්කයට ද එකක් ගම්පහ දිස්ත්‍රික්කයට ද අයත් වේ. එබැවින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාගරික කලාප කොළඹ දිස්ත්‍රික්කය වටා ඒකරාශි වී ඇත. නගර කරා ඇද ගැනීමේ සාධක ලෙස අධ්‍යාපන පහසුකම් ප්‍රසාරණය වීම, යටිතල පහසුකම් ප්‍රසාරණය වීම, නගරවල සුවපහසු ජීවිතයක් ගත කල හැකි වීම, රාජ්‍ය හා පෞද්ගලික ආයතන පිහිටුවීම නිසා රැකියා අවස්ථා බහුලවීම, ප්‍රධාන සේවා මධ්‍යස්ථාන පිහිටීම ආදිය දැක්විය හැකි ය. මේනිසා නගරවල වාසය කරන සියලුම දෙනාට වැඩි වැටුපත් සහිත රැකියා ලබා ගැනීමේ ගැටළුවක් පවතී. මේ නිසා නාගරීකරණය ආශ්‍රිතව විවිධ සමාජීය හා පාරිසරික ගැටළු රාශියක් හඳුනා ගැනීමට

හැකියාව ලැබේ. එහෙයින් සමහරු සුළු මුදලක් උපයා ගත හැකි අවිධිමත් අංශයේ සුළු වෙළදාම, විවිධ සේවා සැපයිම, පදික වෙළෙදාම වැනි රැකියාව, නිරත වේ. නමුත් තවත් කොටසක් නිත්‍යානුකල නොවන හිගාකෑම, මනුෂ්‍ය ඝාතන, ගනිකා වෘත්තිය, ගැට කැපිම, සොරකම් හා මත්ද්‍රව්‍ය අලවිය වැනි අපචාරී ක්‍රියාවන්හි නියැලේ. ඔවුන්ගේ ආදායම අඩු ය. එමනිසා ඔවුන්ට පදිංචියට සුදුසු නිවසක් සපයා ගැනිම දුෂ්කර වේ. එමනිසා මොවුන් අතරින් වැඩිදෙනෙකු මුඩුක්කු හෝ අනවසරයෙන් තැනූ පැල්පත්ව, ජිවත් වේ.

මෙම පැල්පත් මුඩුක්කු ආදියෙහි විශාල ජන සංඛ්‍යාවක් ජිවත්වීම නිසා පැනනගින තවත් ප්‍රශ්නයකි සෞඛ්‍ය ගැටළුව. මේ හේතුවෙන් නිවාස තුළ තදබදයක් පවතින අතර එම නිවාස තුළින් බැහැර කරනු ලබන කැළි කසළ නිසි ආකාරයෙන් බැහැර කිරිමට ස්ථාන නොමැති වීම හා නිවාස ආසන්නයේ ම ඉවත් කිරිම හේතුවෙන් නාගරික අපිරිසිදු බවක් ඇති වේ. තව ද වර්ෂාවත් සමඟ මෙම කැළි කසළ ජලයට එකතු වීමෙන් දුර්ගන්ධය වහනය වනවා මෙන් ම මැසි මදුරු හා කෘමීන් බෝවන ස්ථාන බවට පත්වේ. එය බරවා, ඩෙංගු , පාචන වැනි භයානක රෝග වේගයෙන් පතුරුවා හරියි නාගරික ජනාවාසවල කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් ස්ථාපිත කර ඇති හෙයින් මෙම ප්‍රදේශවල ජල දූෂණය, වායු දූෂණය මෙන්ම, පාංශු දූෂණය වැනි පාරිසරික ගැටළු රැසක් ඇති කරනු ලබයි. ඒ අතර, මෙම කම්හල් වලින් බැහැර කරන රසායකින ද්‍රව්‍ය සහිත අපවිත්‍ර ජලය ඇතුලු අපද්‍රව්‍ය ඒ අවට ජලාශ වලට මුදාහරිනු ලබයි. එමෙන් ම මෙම රසායනික ද්‍රව්‍ය හා ඛණිජ වර්ග එකතු වීමෙන් මෙම ප්‍රදේශව, භූගත ජලය ද අපවිත්‍ර වේ. මෙම ප්‍රදේශවල, ජිවත්වන ජනයාගේ ශරීර සෞඛ්‍යට ද මෙය අහිතකර වේ.

රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදෙස්ගත වීමේ සංඛ්‍යාව වැඩි වීම.

සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් සිදුවන ජන සංක්‍රමණ ප්‍රමාණය අති විශාලය. විශේෂයෙන්ම සංවර්ධිත රටවල් කරා ඇදී යන්නේ සංවර්ධනය වෙමින් පවතින රටව, වෘත්තිය දක්ෂතා ඇති පුදගලයින් වේ. මේ තුළින් සංවර්ධිත රටව, නිෂ්පාදනය ඉහළ යාමක් සිදුවුවත්, සංවර්ධනය වෙමින් පවතින රටවලට තම වෘත්තිය දක්ෂතාවයන් ඇති පුද්ගලයින් අහිමිවීමෙන් ශ්‍රම බලකායේ සංකෝචනයක් සිදු වේ. එය සංවර්ධනයවෙමින් පවතින රටකට එනම් ශ්‍රී ලංකාව වැනි රටකට නිෂ්පාදනය හා ආර්ථික වර්ධනයේ පසුබෑමකට හේතුවිය හැක. 2012 ජන හා නිවාස සංගණනයට අනුව තාවකාලිකව මාස හයට වඩා වැඩි කාලයක් විදේශගතව ජිවත්වන මුළු ජනගහණය 604,540ක් ලෙස වාර්තා වේ. මෙම සංඛ්‍යාවෙන් 59%ක් පුරුෂයන් වේ. විදෙස්ගත ජන සංඛ්‍යාවෙන් 47% අධ්‍යාපනය සඳහා ඇ.එ.ජ, ඕස්ට්‍රේලියාව යන රටවලට ගොස් ඇති බව වාර්තා වේ. ජත්‍යන්තර සංක්‍රමණ නිසා ශ්‍රි ලංකාව වැනි රටකට මුහුණ පාන්නට සිදුවන තවත් ගැටළුවකි. බුද්ධි ගලනය මෙරටින් සංක්‍රමණය වන පිරිස අතර, උගත් මෙන්ම බුද්ධිමත් වෘත්තිය දක්ෂතා ඇති පිරිස ද විශාල ය. මොවුන්ගේ වෘත්තිය දක්ෂතා ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අප රටේ රජය විශාල වියදමක් දරා තිබේ.

නමුත් මෙම බුද්ධිය පිටතට ගලා යාම නිසා ඔවුන් වෙනුවෙන් මෙරට රජය විසින් දැරූ වියදමවත් පියවා ගැනිමට අවස්ථාව නොලැබී යයි. තවද මෙම බුද්ධි ගලනයට හේතුවක් ලෙස උගත් දැනුමට සරිලන පරිදි රැකියා නොමැති වීම ආදී හෙතුන් ද ගෙනහැර දැක්විය හැකිය. එමෙන්ම බුද්ධි ගලනයේ දී සංක්‍රමණයට සහභාගී වන්නේ තනි පුද්ගලයන්ට වඩා පවුල් ඒකක වේ. එමනිසා ඔවුනට ප්‍රේෂණ මුදල් තම රටට බැර කිරිමේ අවශ්‍යතාවයක් ඇති නොවේ. තම දූ පුතුන්ට උසස් අධ්‍යාපනයක් ලබාදීමටත්, අනාගත ප්‍රයෝජනය සඳහා ඔවුන් තමන් උපයන මුදල් එම රටේම රඳවා තබා ගනි. එය ද අප රටට අවාසියකි.

එසේම ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ඇතිවන තවත් ගැටළුවක් ලෙස සමාජීය ප්‍රශ්න වර්ධනය වීම දැක්විය හැකි ය. මෙවැනි ජන සංක්‍රමණ නිසා දෙමාපියන් හා දරුවන් තාවකාලකව හෝ වෙන්වේ. එය පවුල් පද්ධතිය දුර්වල කරයි. ඒ තුළින් අඹුසැමි ප්‍රශ්න හා දරුවන් සම්බන්ධ ප්‍රශ්න ද ඇති වේ. එමෙන් ම දෙමාපියන් විදේශ රටවලට සංක්‍රමණය වී රැකියා කිරීම තුළින් එම පවුල්ව, අදායම් මට්ටම ඉහළ යයි. එනිසා එම පවුල් ඉහළ මට්ටමේ වියදම්ඳවලට හුරු වේ. නමුත් යම් ලෙසකින් මෙම විදේශ රැකියා අහිමි වුවහොත් ආදායම මට්ටම පහළ වැටී දැඩි අපහසුතාවන්ට මුහුණ පෑමට සිදුවේ. මෙලෙස ජත්‍යන්තර සංක්‍රමණ සිදුවීම තුළින් ඇති කරන සමාජීය ගැටළු ද හඳුනාගත හැකි ය.

4. ළමා ජන සංඛ්‍යාව අඩු වීම.

ළමා ජන සංඛ්‍යාව ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 14ට වඩා අඩු ජන සංඛ්‍යාවයි. එය 2012 දී 25.2% ලෙස වාර්තා වේ. බාල වයසේ ජන සංඛ්‍යාව කිසියම් රටක ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ අතර වැදගත් ලක්ෂයක් ලෙස සැලකිය හැකි වන අතර එහි ප්‍රතිශතය අඩු වීම යනු එම රටෙහි ජන සංඛ්‍යාවේ සීඝ්‍ර අඩු වීමක් හා ශ්‍රම බලකායේ අඩු වීමක් අනාගයේදී ඇතිවිය හැකි බවට හොඳ සාක්ෂිය කි. එමෙන් ම ලෝකයේ විවිධ රටවල් ආශ්‍රයෙන් ගින්ස්බර්ග් කළ අධ්‍යයනයට අනුව පෙනී ගොස් ඇති කරුණක් වන්නේ බාල වයස් ජන සංඛ්‍යාව ලෝකයේ ධනවත්කම හා ප්‍රතිලෝම සම්බන්ධතාවයන් ප්‍රකට කරන බවයි. (ද සිල්වා,2008) ළමා ජන සංඛ්‍යාව අඩු වීම සඳහා බලපාන සාධකයක් ලෙස විවාහ වීමේ වයස ප්‍රමාණය වැඩිවීම හා පවුල් සැලසුම් ක්‍රමවල භාවිතය ද දැක්විය හැක. එසේම මෙහිදී ස්වභාවික වර්ධන වේගය ඍන අගයක් ද ගැනිමට ඉඩකඩ පවති. එසේම අනාගතයේදි රටේ ශ්‍රම හිඟයක් ඇති වී වෙනත් රටවලින් ශ්‍රමිකයන් ගෙන්වා ගැනිමට සිදුවනු ඇත. එය සමාජ ගැටලුවලට ද හේතු විය හැකි ය. අනාගතයේදී දේශීය තරුණ පිරිස අඩු වීමත් සංක්‍රමණ අධික විමත් නිසා රටේ ආරක්ෂාවට තර්ජනයක් ඇති වීමට ද ඉඩකඩ ඇත. වැඩකරන වයසේ ජනගහනය වර්ධනය වන අතරතුර ළමා ජනගහනය අඩු විම සහ වයස්ගත ජනගහනයේ ප්‍රමාණය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතින විට ආර්ථික සංවර්ධනයට හිතකර ප්‍රජා විද්‍යා පාරිතෝෂිකය යනු වැඩ කරන වයසේ ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේ අඩු වර්ධනයක් ඇති අවස්ථාවේදී ලබා ගත හැකි සීග්‍ර ආර්ථික වර්ධනයයි.

වගුව 01: ශ්‍රී ලංකාවේ ළමා සහ වයස්ගත ජනගහනය

| වර්ෂය | ළමා ජනගහනය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස | වයස්ගත ජනගහන මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ය |
|---|---|---|
| 1971 | 71.8 | 11.5 |
| 1981 | 60.5 | 11.3 |
| 1991 | 51.4 | 13.3 |
| 2001 | 38.9 | 15.4 |
| 2011 | 35.6 | 20.4 |
| *2021 | 30.4 | 26.2 |
| *2031 | 25.5 | 32.8 |
| *2041 | 25.3 | 41.4 |
| *2051 | 26.5 | 51.2 |

*ප්‍රක්ෂේපිත දත්ත මූලාශ්‍රයඃ ද සිල්වා,(2008)

වගු අංක 01 ට අනුව 1971 දී ළමා ජනගහනය 71.8 වන අතර එය ක්‍රමයෙන් අඩු වී ඇත. 1981, 1991, 2001 යන වර්ෂ වලදී එය පිළිවෙලින් 60.5, 51.4, 38.9 ලෙස හඳුනාගත හැකි ය. 2021 වන විට ද එම අගය 30.4 දක්වා ද 2051 වන විට 26.5 දක්වා ද ළමා ජනගහනය අඩු වනු ඇතැයි ප්‍රක්ෂේපනය කෙරේ. එමෙන් ම ළමා ජනගහනයට සාපේක්ෂව වයස්ගත ජනගහනය ක්‍රමයෙන් වැඩිවන බවක් මෙහිදී හඳුනාගත හැක. 1981 වසරේ 11.3 වූ වයස්ගත ජනගහනය 1991, 2001, 2011 යන වර්ෂවල දී පිළිවෙලින් 13.3, 15.4, 20.4 දක්වා වැඩි වී ඇත. එමෙන් ම 2021 වන විට 26.2 දක්වාද 2051 වන විට 51.2 දක්වා ද වැඩි වනු ඇතැයි ප්‍රක්ෂේපනය කෙරේ. මෙහිදී 2051 වන විට මුළු ජනගහනයෙන් හරි අඩකට වඩා වයස්ගත ජනගහනය නැතිනම් මහලු යැපෙන්නන් සිටිනු ඇතැයි ප්‍රක්ෂේපනය කෙරේ. මෙම තත්වය රටේ ඉදිරි සංවර්ධනයට එක එල්ලේ බලපෑම් එල්ල කරනු ඇත.


5. ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ප්‍රවනතාවක් දක්නට ලැබීම.

ජනගහනය වියපත් වීමේ ප්‍රජා විද්‍යාත්මක ක්‍රියාවලිය සාපල්‍යතාව අඩු වීමට සමගාමීව සිදු වූවකි. සාපල්‍යතාවයේ සහ මර්ත්‍යතාවයේ සීග්‍ර පහළ බැසිම, ඍන ජාත්‍යන්තර ශුද්ධ සංක්‍රමණය හා ඉහළ ආයු අපේක්ෂාවක් පැවැතිම ජනගහණයය වයස්ගත වීමට හේතු වේ. ශ්‍රී ලංකාවේ අවුරුදු 60 වැඩි වැඩිහිටි ජනගහනය 2012 වන විට මිලියන 2.5 කි. මෙය මුළු ජනගහණයෙන් 1/8 කි. 2012 සංගණනයේ සංඛ්‍යා ලේඛණවලට අනුව දළ මරණ අනුපාතිකය 5.7 ක් දක්වා පහළ බැස ඇති ආකාරය හදුනාගත හැකි ය. මේ සඳහා ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය හා පෝෂණ මට්ටම වර්ධනය වීම බලපාන්නට ඇත. මරණ අනුපාතය පහළ මට්ටමක පවතින හෙයින් වයස්ගත වූවන් සදහා ආර්ථිකයේ වැඩි ප්‍රමාණයක් වෙන් කිරිමට සිදුවීම නිසා ආර්ථිකය අවධානම් මට්ටමක පවතී. මෙහිදී මහලු යැපුම් අනුපාතිකය 12.4 දක්වා ඉහළ ගොස් ඇති බව හදුනා ගත හැක.

මෙම තත්වය සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවට අහිතකර තත්වයක් බවට පත් වන්නේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට ඇති මුදලින් විශාල ප්‍රමාණයක් වයස්ගත වූවන්ගේ සුභසාධන කටයුතු සඳහා යෙදවීමට සිදු වීම හේතුවෙනි.

ප්‍රස්තාරය 03: වයස්ගත ජනගහනය 1946 - 2012

**Figure 11 : Ageing population 1946-2041**




*Source: UNFPA Sri Lanka Census 2012 http://countryoffice.unfpa.org/srilanka/drive/Census-2012.pdf*

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව, 2012

මෙය 2041 වන විට මිලියන 5.4 ක් දක්වා වැඩි වේ යැයි අපේක්ෂිත ය. එසේ වුවහොත් මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 24.8 කි. එනම් 2041 වන විට මිනිසුන් හතර දෙනෙකුට එක් අයෙක් වියපත් මිනිසෙකු බවට පත්වේ. (ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය, 2011)

6. මුළු ජනගහනයෙන් ස්ත්‍රී ප්‍රතිශතය ඉහළ යාම.

සංගණන ඉතිහාසයේ පළමු සංගණනය වන 1871 සිට 1981 දක්වා පවත්වන ලද සෑම සංගණනයකදී ම මුළු ජනගහණයෙන් පුරුෂ ප්‍රතිශතය ස්ත්‍රී ප්‍රතිශතය අභිබවා වර්තා වී ඇත.1946 දි 46.9% වූ ස්ත්‍රී ජනගහනය 1981 වන විට 49% ලෙස ද 2012 සංගණනයට අනුව එය 51.6% ලෙස ද වර්ධනය වී ඇත. මීට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පුරුෂයන් හා සැසඳීමේදි ස්ත්‍රීන් ඉහළ ආයු අපේක්ෂාවක් භුක්ති විඳීම , මාතෘ මර්ත්‍යතාවේ සීග්‍ර පහළ බැසීම ආදී සාධකයන් ය. ස්ත්‍රීන්ගේ ජීවිත අපේක්ෂාව පුරුෂයන්ට වඩා වැඩි බැවින් වැඩිහිටි ජනගහනයේ වැඩිකොටසක නියෝජනයක් ස්ත්‍රී පක්ෂයට හිමි වී ඇත. එසේ ම 2012 දි ස්ත්‍රීන් 100 දෙනෙකුට සිටින පිරිමි සංඛ්‍යාව 79 ක් වේ.

7. විවාහ වීමේ වයස ඉහළ යාම.

විවාහක තත්ත්වය යනු ජනගහණය වෙනස් වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන සාධකයක් ලෙස ද සැලකිය හැක. රටක සාපල්‍යතාව කෙරෙහි ඍජු ලෙස ද මර්ත්‍යතාවය සහ සංක්‍රමණ කෙරෙහි ද විවාහක තත්ත්වය බලපායි. ඒ හැරුණ විට අධ්‍යාපන තත්වය, ශ්‍රම බලකා සහභාගීත්වය වැනි සමාජීය සහ ආර්ථික ලක්ෂණයන් කෙරෙහි ද පුද්ගලයෙකුගේ විවාහක තත්වය බලපානු ලබයි. වයස අවුරුදු 20-24 අතර කාණ්ඩයේ පමණක් 1971 සිට 2012 දක්වා විවාහක ප්‍රතිශතය ඉතා සුළු වශයෙන් වුවද ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් පවති.

මූලික අධ්‍යාපනයට අමතරව කාන්තාවන් විශාල වශයෙන් පූර්ණ කාලීන උසස් අධ්‍යාපන කටයුතුවල යෙදීමේ වැඩිවීමක් මෑත කාලයේ දක්නට ලැබීම මේ සඳහා හේතු වී ඇතැ යි උපකල්පනය කළ හැක. 2012 සංඛ්‍යා දත්තවලට අනුව කාන්තාවන්ගේ විවාහ වන වයස 23.4 ලෙස වාර්තා වේ. එසේම 2012 වර්ෂයේ දී විවාහවන පූරුෂයකුට වඩා ස්ත්‍රීන් වසර 4කින් පමණ ලාබාල වේ. විවාහවන අවස්ථාවේ දී පුරුෂයා සහ ස්ත්‍රිය අතර අඩු වෙමින් පවතින මෙම වයස් පරතරය සඳහා මූලිකවම බලපා ඇත්තේ ස්ත්‍රීයගේ විවාහවන වයස ඉහළ යාම බව පැහැදිලිය.

8. ප්‍රධාන නගරවලින් බැහැරව අවට ප්‍රදේශවල ජන සංකේන්ද්‍රණ බිහි වීම.

විශේෂයෙන් ම මෙය ද වර්තමානයේ දැකිය හැකි ප්‍රවනතාවක් ලෙස හඳුනාගත හැක. ප්‍රධාන නගරයෙන් බැහැරව ඒ අවට ප්‍රදේශවල ජනයා සංකේන්ද්‍රණය වනුයේ නගර ආශ්‍රිතව පවතින දැඩි කලබලකාරී බවින් මිදීමේ අපේක්ෂාවෙනි. එමෙන් ම මෙම ප්‍රදේශවල ජනයා අපේක්ෂා කරන සේවා සහ අනෙකුත් පහසුකම් භුක්ති විඳීමේ අපේක්ෂාවෙන් මොවුන් මේ ප්‍රදේශවල ජන සංකේන්ද්‍රණ ඇති කර ගැනිමට පෙළඹීමේ ප්‍රවනතාවක්ද දක්නට ඇත.

මෙලෙස ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑත කාලීන උපනතීන් හඳුනාගත හැකිය.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ ජනගහනය මෑත කාලීන උපනතීන් පිළිබඳව අධ්‍යයනයේ දී ජන සංඛ්‍යා වර්ධන වේගය ක්‍රමයෙන් පහළ බැසීම, ළමා ජන සංඛ්‍යාව අඩු වීම, වයස්ගත ජනගහනය වැඩි වීම, ස්ත්‍රී ප්‍රතිශතය ඉහල යාම, සංක්‍රමණ ආදී උපනතීන් හඳුනාගත හැකිය. එසේම ඉහළ ජීවන තත්වයක් සහ නිසි අධ්‍යාපනයක් ලබා උසස් රැකියාවක නියැලීමේ අරමුණු ඇතිව විදෙස්ගතවන පිරිසක් ද වර්තමානය වන විට ඉහළ අගයක් ගන්න බව හඳුනාගත හැකිය. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ ජනගහනයේ ලක්ෂණ අනුව ඒ තුළ තවදුරටත් විවිධ උපනතීන් සිදුවිය හැකි බව කිව හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අබේකෝන් ලඒ.ටී.පී.එල් (2008). ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත්වීම සම්බන්ධයෙන් මතු වෙමින් පවතින ගැටළුල ආර්ථික විමසුම ශ්‍රී ලංකා මහජන බැංකුව.

ආර්ථික විමර්ශන, (1998), ආර්ථික විද්‍යා අංශයේ අර්ධ වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය,කැළණිය විශ්වවිද්‍යාලය,කැලණිය,ශ්‍රී ලංකාව.

ආරියවංශ දිසානායක,ප්‍රජා විද්‍යාත්මක දත්ත මුලාශ්‍ර සහ 1946 න් පසු ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන උපනතීන් පිළිබඳ විග්‍රහයන්, සම්භාෂා කලාපය 8 - 1997 අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය.

ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව, (2014), ආර්ථික සංගණනය 2013/2014 - ශ්‍රී ලංකාව, (2014) කොළඹ:ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව.

ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව,(2014), 2012 ජන හා නිවාස සංගණනයේ ප්‍රධාන තොරතුරු, කොළඹ:ජන හා සංඛ්‍යාලේඛන දෙපර්තමේන්තුව.

ජයකොඩි සරත් කේ.,(2008),ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනය,අභියෝග සහ ප්‍රතිචාර,කතෘ ප්‍රකාශනයකි.

ද සිල්වා, ඩබ්ලිව්. අයි (2008),ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනය සහ සමාජ ආරක්ෂණය,ආර්ථික විමසුම, ශ්‍රී ලංකා මහජන බැංකුව.

ප්‍රියදර්ශන, ටී.ආර්, (2012). ජනගහන වියපත්වීමේ අර්ථික හා සමාජීය ප්‍රතිවිපාක සටහන , ශ්‍රී ලංකා මහජන බැංකුව

Casley D.J. and Lury D.A.,(1982), Data collection in developing countries,Oxford University Press,New York,United States.

Department of census and statistics, (2014), Sri Lanka labor forces survey, printing division, Department of census and statistics.

Hinrich N., Population environment and people, (1971),United States of Amereca.